සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

**දෙවන වාර පරීක්ෂණය 2018** | **11 ශ්‍රේණිය**
**இரண்டாம் தவணைப் பரீட்சை 2018** | **தரம் 11**
**Second Term Test 2018** | **Grade 11**

**නාට්‍ය හා රංග කලාව I**
**Drama & Theaters I**

**පැය 1 යි**
***One hours***

නම/විභාග අංකය - ........................................................................................................................................

සැලකිය යුතුයි.

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- අංක 1-40 දක්වා ප්‍රශ්න වලට 1 2 3 4 වරණ වලින් නිවැරදි වරණය තෝරන්න.
- පිළිතුරු සැපයීම සඳහා ඔබට ලබා දෙන කොටු කොළය භාවිතා කරන්න.

- **පහතදැක්වෙනපද්‍ය කොටස් ඇසුරු කර ගනිමින් 01 සිට 06 දක්වා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

**I.** රුදුරුමරුයකාමුගුරක්ගෙනඅතට
විදුරු තරු දෙකා මෙන් නෙත් රැවිය මට
ඇඳුරු මට දැකා නර බිල්ල ගන්නට
පැදුර පිට තැබුවා යකුට කන්නට

**II.** අත්තක පිපි මලක් ලෙසේ
පෙත්තක ඇඳි ඉරක් ලෙසේ
සන්තක මගෙ පුතුගෙ යසේ
නෙත් දෙක ඇර බලන් මෙසේ

**III.** දිරියෙන් යුධ කළ ඔබ සමගින්නේ
සෙනෙගින් පිහිටද නොම සොයමින්නේ
තනියෙන් සටනට සැරසී එමින්නේ
මෙකගින් ඇයි ඔහු ගෙළ සිඳලන්නේ

**IV.** ගම්බිර කාලිංග නුවර නිරිඳුගෙ වාසල පුරයට
ඉන්න දනා සේම රජුට සෝදා පට පිළී හොඳට

**V.** උත්තම මන් ලොව පතලා
එංගලන්ත නමින් යුතු විපුලා

01. දේශීය ශාන්ති කර්ම වලට අයත් පද්‍ය වන්නේ,
1.I හාII    2. II හාIII    3. III හාIV    4. I හා III

02. ගැමි නාටකයකට අයත් පද්‍ය වන්නේ,
1. I    2. II    3. III    4. IV

03. උඩරට ප්‍රධාන ශාන්ති කර්මයට අයත් පද්‍ය වන්නේ,
1. I    2. II    3. III    4. IV

04. එදිරිවීර සරච්චන්ද්‍රයන් විසින් නිෂ්පාදනය කළ නාට්‍යකට අයත් පද්‍යකි,
1. V    2. IV    3. III    4. II

05. නූර්ති නාට්‍ය සම්ප්‍රදායට අයත් පද්‍ය වන්නේ,
1. II    2. III    3. IV    4. V

- **පහත දැක්වෙන සිදුවීම ඇසුරින්අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

ගහසිරිපුර විද්‍යාලයේ කලා උළෙල වෙනුවෙන් නාට්‍යක් නිෂ්පාදනය කිරීමට ශිෂ්‍ය කණ්ඩායමකට භාරදුන් සාහිත්‍ය ගුරුතුමා ඔහු විසින් රචනා කළ නාට්‍ය පිටපතක් ඒ සඳහා ලබා දෙන ලදී. ඉන් අනතුරුව ශිෂ්‍ය කණ්ඩායමේ සිසුන් පිරිසකට පහත දැක්වෙන කාර්යයන් පවරන ලදී.

කමල් - නාට්‍යයේ ඇඳුම් නිර්මාණය      පියුමි - නාට්‍ය සඳහා සංගීත නිර්මාණය

ගාමිණී - පසුතලය නිර්මාණය කිරීම.     සඳුනි - අංග රචනය සිදු කිරීම.

කෝසල - නාට්‍යයේ අධ්‍යක්ෂක ලෙස කටයුතු කිරීම.

06. නාට්‍යයේ අධ්‍යක්ෂක ලෙස පිටපත බාරගත් කෝසල විසින් සිදු කළ යුතු පළමු කාර්ය වන්නේ,
   1. නළුවරණය සිදු කිරීම .   2. පුහුණුවීම් ආරම්භ කිරීම.
   3. පිටපත අධ්‍යයනය කිරීම.   4. අනුෂංගික ශිල්පීන් තෝරා ගැනීම.

- **07 සිට 11 සඳහා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරන්න.**

07. ඇඳුම් නිර්මාණයේදී කමල් විසින් සිදු නොකළ යුත්තකි,
   1. නාට්‍ය යේ ශෛලිය පිළිබඳ අවධානය යොමු කිරීම.
   2. අලංකාරය පිළිබඳ වැඩි අවධානය යොමු කරමින් ඉතා වටිනා ඇඳුම් නිර්මාණය
   3. නළුවාට පරිහරණය කිරීමේ පහසුව පිළිබඳ අවධානය යොමු කිරීම.
   4. සෙසු අනුෂංගික කලා පිළිබඳ අවධානය යොමු කිරීම.

08. නාට්‍යයේ සංගීතය නිර්මාණය කිරීමට බාරව සිටින පියුමි එහිදී වඩාත් සැලකිලිමත් විය යුත්තේ ,
   1. පිටපත කියවා බලා තමන්ට අවශ්‍ය ආකාරයට සංගීතය නිර්මාණයකිරීම.
   2. සංගීතය වඩාත් මතුවන ලෙස අඛණ්ඩ සංගීතයක් ලබා දීම.
   3. ශෛලිය ,තේමාව පිළිබඳ අවබෝධයෙන් පිටපත විසින් අවශ්‍යතාව මතු කරන අවස්ථාවන්ට සංගීතය නිර්මාණය
   4. තමාගේ උපරිම හැකියාවන් දැක්විය හැකි පරිදි සංගීතය නිර්මාණය

09. ගාමිණීට නාට්‍යයේ පසුතලය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට වඩාත් ප්‍රයෝජනවත් වේ,
   1. නාට්‍යයේ සංවාද   2. රංග විධාන   3. චරිත ලක්ෂණ   4. තේමාව

10. සඳුනිට මෙම නාට්‍යයේ අංග රචනය භාර වී තිබෙන අතර ඇයට එකඟතාවයෙන් කටයුතු කිරීමට සිදුවන ශිල්පියෙකු නො වන්නේ,
   1. නාට්‍ය සංවිධායක   2. වේශ භූෂණ ශිල්පියා
   3. පසුතල නිර්මාණ ශිල්පියා   4. රංගාලෝක ශිල්පියා

- **පහත වගුව ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

| A | B | C | D |
|---|---|---|---|
| තට්ටු ගෙවල් | පුස්ලොඩං | බෙරහඬ | සෙක්කුව |
| නන්දි විශාල | සුදු සහ කළු | ස්වර්ණ හංස | ගැලීලියෝ |
| හිත හොඳ අම්මණ්ඩි | පණ්ඩුකාභය | බෝසතාණෙනි | වරෙන්තු |

11. A හි අඩංගු නාට්‍ය නිෂ්පාදන කරන ලද්දේ,
   1. හෙන්රි ජයසේන මහතා   2. සුගතපල ද සිල්වා මහතා
   3. එදිරිවීර සරච්චන්ද්‍ර මහතා   4.සයිමන් නවගත්තේගම මහතා

12.පරාක්‍රම නිරිඇල්ල මහතා විසින් නිෂ්පාදනය කරන ලද නාට්‍ය අඩංගු ඛාණ්ඩය වන්නේ,
   1. A   2. B   3. C   4. D

13.C හි අඩංගු නාට්‍ය නිෂ්පාදන කරන ලද්දේ,
   1. ජයවර්ධන මහතා   2. සුගතපල ද සිල්වා මහතා
   3. ගුනසේන ගලප්පත්ති මහතා   4. හෙන්රි ජයසේන මහතා

14. ග්‍රීක නාට්‍යකරු සොෆොක්ලීස් ගේ ඉක්නෙච්ටා ඉ නම් සැටර් නාට්‍ය ඇසුරින් නිර්මාණය කළ නාට්‍ය වන්නේ,
   1. හිත හොඳ අම්මණ්ඩි   2. පුස්ලෝඩං   3. බෙරහඬ   4. ගැලීලියෝ

15. Bහි අඩංගු නාට්‍ය නිෂ්පාදන කරන ලද්දේ,
   1. දයානන්ද ගුණවර්ධන මහතා   2. ජයලත් මානෝරත්න මහතා
   3. සයිමන් නවගත්තේගම මහතා   4. සුගතපාග ද සිල්වා මහතා

- **16 සිට 18 දක්වා ප්‍රශ්න වල නොගැළපෙන වරණය තෝරන්න.**

16. නාට්‍ය අධ්‍යක්ෂණයේ දී ,
    1. අධ්‍යක්ෂවරයා තමාගේ කණ්ඩායමේ අය පිළිබඳ මනා අවබෝධයෙන් සිටිය යුතු ය.
    2. අධ්‍යක්ෂවරයා එහි ප්‍රධානියා බැවින් ඔහුගේ අභිමතයට සියළු කටයුතු සිදු කළ යුතු ය.
    3. සාමූහික ක්‍රියාවලියක් බැවින් සෙසු අදහස් විමසීම ඉතා යෝග්‍ය වේ.
    4. අධ්‍යක්ෂවරයා වඩාත් නිර්මාණශීලීව කණ්ඩායම හැසිරවිය යුතු ය.

17. නූර්ති නාට්‍ය කලාවේ රංග ශෛලියේ සුවිශේෂී ලක්ෂණ වේ.
    1. දක්ෂිණ භාරතීය කර්ණාටක සංගීතය භාවිතය.
    2. විචිත්‍ර වූ පසුතල සංකේතවත් කරන චිත්‍ර වස්ත්‍ර භාවිතය.
    3. ස්ත්‍රී චරිත ස්ත්‍රීන් විසින්ම නිරූපණය කිරීම.
    4. ප්‍රොසීනියම් වේදිකාව මුල් වරට භාවිතයට ගැනීම.


18. ජෝන්ද සිල්වා මහතා විසින් නිර්මාණය කරන ලද නූර්තිය වේ,
    1. රාමායනය  2. සිරිසඟබෝ  3. පද්මාවතී  4. නල රාජ චරිතය

- **19 සිට 20 දක්වා ප්‍රශ්න වල නිවැරදි පිළිතුර තෝරන්න.**

19. චාල්ස් ඩයස් විසින් ආරම්භ කළ රඟහල වන්නේ,
    1. ටවර් රඟහල  2. ජෝන්ද සිල්වා රඟහල  3. ලුම්බිණි රඟහල  4. ලයනල් වෙන්ඩ් රඟහල

20. එම රඟහල විවෘත කරමින් ඔහු විසින් රඟ දැක්වූ නූර්තිය වන්නේ,
    1. රාමායනය  2. පද්මාවතී  3. පණ්ඩුකාභය  4. නාගානන්ද

- **පහත දැක්වෙන රූප සටහන ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**




21. මෙම රංග භූමියේ A ලෙස දක්වා ඇති කොටස පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය වන්නේ,
    1. මෙය නළුවන් රංගය සඳහා වෙස් ගන්වන ස්ථානය යි.
    2. නළුවන් තමාගේ වාරය එළඹෙන තෙක් මෙහි පසු පස රැඳී සිටියි.
    3. මෙය කණු සිටුවා බුරුල්ල කොළ අතු වලින් ආවරණය කර තිබේ.
    4. මෙම ස්ථානයට පසු පසින් මඩුව තිබේ.

22. මෙහි රංගය පූර්ව හා අපර ලෙස කොටස් දෙකකි. පූර්ව රංගයේදී පැමිණෙන චරිත පමණක් අඩංගු වරණය වන්නේ,
    1. තොරතුරු කතා කාරයා , අණ බෙර කෝළම , හේවා කෝළම , රජු සහ බිසව
    2. රජු සහ බිසව , අණ බෙර කෝළම , හේවා කෝළම , මුදලි
    3. අණබෙර කෝලම , රජු , කාරිය කරවන රාළ , මුදලි
    4. තොරතුරු කතා කාරයා , අණ බෙර කෝළම , හේවා කෝළම , පොලිස් කෝළම

23. මෙහි දී යොදා ගන්නා ප්‍රධාන වාද්‍ය භාණ්ඩය වන්නේ,
    1. දවුල  2. ගැටබෙරය
    3. දික්බෙරය  4. මද්දලය

24. මෙම නාට්‍ය සම්ප්‍රදායේ සුවිශේෂී ලක්ෂණයක් නො වන්නේ,
1. හාස්‍ය හා උපහාසය මතු කිරීම ප්‍රධාන අරමුණයි.
2. ප්‍රධාන චරිත කිහිපයක් පමණක් වෙස් මුහුණු පළඳියි.
. චරිත හඳුන්වා දීම කාරිය කරවන රාළ විසින් සිදුකරයි.
4. රාත්‍රී කාලයේ දින කිහිපයක් රඟ දක්වයි.

- **25 සිට 29 දක්වා ප්‍රශ්න වලට සපයා ඇති ඡායාරූප ඇසුරින් පිළිතුරු සපයන්න.**


A


B


C


D

25. මෙහි A හි සිටින නාට්‍ය ශිල්පිණිය වන්නේ,
1. මානෙල් ජයසේන මහත්මිය
2. මැණිකේ අත්තනායකමහත්මිය
3. අනුලා බුලත්සිංහලමහත්මිය
4. රම්‍යා වනිගසේකර මහත්මිය

26. ඇය රඟ පෑ ප්‍රසිද්ධ වේදිකා නාට්‍යයකි,
1. රතු හැට්ටකාරී
2. හුණු වටයේ කතාව
3. ගජමන් පුවත
4. කැළණි පාලම

27. මනමේ නාට්‍යට සම්බන්ධ වූ ශිල්පියා හෝ ශිල්පිණිය වන්නේ,
1. A
2. B
3. C
4. D

28. කුවේණි නාට්‍යට රංගනයෙන් දායක වූ ශිල්පියා හා ශිල්පිණිය වන්නේ,
1. Aහා B
2. B හා D
3. C හා D
4. A හා C

29. ඔත්තුකාරයා ,මරසාද් , ධවල භීෂණ යන නාට්‍ය වලට රංගනයෙන් දායක වී ඇත්තේ,
1. D
2. C
3. B
4. A

- **30 , 31 ප්‍රශ්න වලට රූප ඇසුරින් පිළිතුරු සපයන්න.**


A


B

30. මෙහි A දක්වා ඇති ආලෝක පහන වඩාත් ප්‍රයෝජනවත් වන්නේ,
1. ගගනිකාව ආලෝකවත් කිරීමට
2. සම්පූර්ණ වේදිකාව ආලෝකවත් කිරීමට
3. යමක් හෝ කෙනෙකු වෙන් කර දැක්වීමට
4. ඒප්‍රනය ආලෝකවත් කිරීමට

31. B රූපයේ දැක්වෙන ආලෝක පහන මගින් ඉටුකළ නොහැකි කාර්යයකි,
1. වේදිකාවේ පසුබිම ආලෝකවත් කිරීම.
2. සම්පූර්ණ වේදිකාව ආලෝකවත් කිරීම.
3. ආලෝක වැටක් ලෙස භාවිතා කිරීම.
4. වළාකුළු , වැස්ස , ගින්දර ඇති කිරීම.

- **32 සිට 35 දක්වාප්‍රශ්නවලටනිවැරදි පිළිතුරු සපයන්න.**

32.නාට්‍යක් සඳහා අවශ්‍ය මූලික අංග වන්නේ,

1. පිටපත , නළු නිළියන් , ප්‍රේක්ෂකයා	2. පිටපත , නළු නිළියන් , අධ්‍යක්ෂක
3. නළු නිළියන් , අධ්‍යක්ෂක , රංග භූමිය	4. පිටපත , නළු නිළියන් , රංග භූමිය

33. ආධුනික රංග ශිල්පියෙකු ස්වකීය කායික සැහැල්ලුව ඇති කර ගැනීම සඳහා නිදර්ශන ලෙස යොදා ගත නොහැකි අවස්ථාවකි ,

1. ඉටිපන්දමක් දල්වා එහි ක්‍රියාකාරිත්වය අධ්‍යයනය
2. හිම කන්දක ඡායාරූපයක් හෝ වීඩියෝ දර්ශන
3. අයිස් කැට දිය වීම.
4. ගිනි කන්දක දර්ශනයක්

34. රංගන ශිල්පියෙකුට මනා හඬ පෞරුෂයක් පවත්වා ගැනීමට සුදුසු රංග අභ්‍යාසය වන්නේ,

1. තාපන අභ්‍යාස	2. ශ්වසන අභ්‍යාස	3. ශිථිලකරණ අභ්‍යාස	4. සංවේදන අභ්‍යාස

35. නෘත සඳහා උදාහරණයක් නොවන්නේ,

1. ලී කෙළි	2. භරත නාට්‍යම්	3. වෙස් නැටුම්	4. කළ ගෙඩි නැටුම්

- **36 හා 37 ප්‍රශ්න වලට පහත තොරතුරු ඇසුරින් පිළිතුරු සපයන්න.**

A සංඛපාල රජු	B පාළඟ කුමරු	C මැණික්පාල බිසය	D රිද්දි බිසව්

36. සන්නි යකුම ශාන්ති කර්මයේ උපත් කතාව හා සම්බන්ධ වන්නේ,

1. A	2. B	3. C	4. D

37.සබරගමුවට ආවේණික වූ ශාන්ති කර්මයක් හා සම්බන්ධ වේ.

1. D	2. C	3. B	4. A

- **38 සිට 40 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරන්න.**

38. ප්‍රාසාංගික කලාවක් නොවන්නේ,

1. චිත්‍රපට	2. රූකඩ	3. බැලේ නාට්‍ය	4. මුද්‍රා නාට්‍ය

39. පහත දැක්වෙන ලක්ෂණ අතුරින් ප්‍රාසාංගික කලාවන්හි ලක්ෂණයක් නොවන්නේ,

1. ප්‍රේක්ෂකයා අනිවාර්ය වීම.	2. සජීවීව ඉදිරිපත් කිරීම.
3. සංස්කරණ ක්‍රියාවලියක් සිදු කිරීම.	4. මිනිස් ශරීරය උපයෝගී කර ගැනීම.

40. සෙසු ප්‍රාසාංගික කලාවන්ට වඩා නාට්‍ය කලාවෙහි සුවිශේෂී ලක්ෂණයක් වන්නේ,

1. අභිනය භාවිතා කිරීම.	2. සජීවීව ඉදිරිපත් කිරීම.
3. රස වින්දනය අභිබවා ජීවිතාවබෝධය ලබා දීම.	4. ප්‍රේක්ෂකයා සහභාගී වීම.